**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන දේපළවලට අදාළ සාධාරණ වටිනාකම වෙන වෙනම පෙන්විය යුතු වුවද, යාල සංචාරක සංවර්ධන කලාපයේ අක්කර 35ක බද්දු ඉඩම් ප්‍රමාණයට අදාල රු.280,000,000 ක් වූ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර 2023 මුදල් වර්ෂය තුළ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | 2023 මුදල් වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය . |
| (ආ) දේපල, පිරියත සහ උපකරණවලට අදාල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 වැනි ඡේදය අනුව, රු.451,545,750 ක පිරිවැයක් සහිත සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් භාවිත කළ හැකි තත්ත්වයේ තිබුණද එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සුන්බුන් වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයේ දී සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟ වේ. මෙම ගැටළුව විසඳීමට කටයුතු කර ඇති අතර දැනට මෙම කාර්යය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව KPMG ආයතනය විසින් සිදු කරනු ලබයි. | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සුන්බුන් වටිනාකම සමාලෝචනය කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් වෙනුවෙන් ලබාදුන් මුදලින් රු.6,496,096 ක්, වියදම් දරන ලද වර්ෂ අනුව හඳුනාගැනීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා තිබුණි. | මේවා වත්කම් උත්පාදනය සඳහා වන වියදම් වන බැවින්, ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු මුළු වියදම් ගිණුම් පොත්වල හඳුනා ගැනේ. | පළාත් සභා මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ලබා දෙන මුදල් වර්ෂයේ වියදම් ලෙස හඳුනා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණයගැතියන් සඳහා බොල් හා අඩමාන ණය වෙන්කිරීම් ප්‍රතිපත්තිය අනුව වෙන්කළ යුතු ප්‍රතිපාදනය රු.42,172,273ක් වුවද, අධිකාරියේ බදුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල වූ රු.9,901,715 ක් ද එකී බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන වටිනාකමෙන් අඩුකර තිබුණි. තවද, ණය ගැතියන්ගේ බැර ශේෂයේ බලපෑම හේතුවෙන් ඉහත ප්‍රතිපාදනයෙන් රු.262,352 ක මුදලක් ද අඩු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අතිරික්තය සහ සමාලෝචිත වර්ෂය අවසානයේ ජංගම වත්කම් රු.10,164,067 කින් වැඩියෙන් දක්වා තිබුණි. | කල්බදු කොන්ත්‍රාත්තුවක් අවසන් වන මොහොතේ බදුකරුගෙන් යම් මුදලක් අයකර ගැනීම සඳහා මෙම තැන්පතු ලබා ගත හැකිය. එබැවින් නියමිත මුදල අයකර ගැනීමේ අවදානම යම් ප්‍රමාණයකට අවම වේ. ඒ අනුව බොල් ණය සඳහා ප්‍රතිපාදන ගණනය කිරීමේදී එම මුදල සලකා බලා ඇත.<br>බොල් ණය සඳහා ප්‍රතිපාදන ගණනය කිරීමේදී බැර ශේෂය රු.262,352 ක් අඩු කිරීම සම්බන්ධ නිරීක්ෂණය සමග එකඟ වේ . | ණය ගැතියන්ගේ බොල් ණය ප්‍රතිපාදන, ආපසු ගෙවිය හැකි තැන්පතු සහ බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්විය යුතු අතර ඒවා එකිනෙකට හිලව් නොකළ යුතුය. |
| (ඇ) දෙද්දූව ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දැරූ රු.39,171,324 ක් වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරීමටත් අත්තිකාරම් මුදල් බැංකුගත කිරීමෙන් ප්‍රාදේශීය ලේකම් ඉපයූ රු. 2,141,427 ක් ලැබිය යුතු පොලී ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කර නොතිබුණි. | තවමත් අත්පත් කර ගැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් ක්‍රියාවලිය අවසන් වන තුරු එය ප්‍රාග්ධනීකරණය කළ නොහැකි අතර, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දෙනු ඇත. එය සම්පූර්ණ කර දැනුම් දුන් පසු අවශ්‍ය ගිණුම්කරණ ගැලපුම් ගිණුම් පොත්වල සිදු කෙරේ. | අවශ්‍ය ගිණුම්කරණ ගැලපුම් ගිණුම් පොත්වල සිදු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු දෑ | 28,408,182 | 26,178,738 | 2,229,444 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ශේෂය තහවුරු කිරීම 2023 මාර්තු 22 වන දින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත යවා ඇත. කෙසේ වෙතත් දැනට ඉහත සඳහන් ශේෂයන්ගේ වෙනස සමථයකට පත් කරමින් පවතී. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනයෙන් ලැබිය යුතු දෑ | 9,023,930 | - | 9,023,930 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ශේෂය තහවුරු කිරීම 2023 මාර්තු 22 වන දින ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනය වෙත යවා ඇත. කෙසේ වෙතත්, මෙම ශේෂය සාක්ෂි නොමැති සහ සංචාරක මණ්ඩල යුගයේ සිට අඛණ්ඩව පවතින ආරම්භක ශේෂයන් බැවින්, නිසි අනුමැතිය සහිතව කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) සංචාරක සංවර්ධන අරමුදලින් ලැබිය යුතු දෑ | 150,278,449 | 226,552,724 | 76,274,275 | සංචාරක සංවර්ධන අරමුදල වෙතින් ලැබිය යුතු මුදල වසර අවසානයේ අරමුදල විසින් සපයනු ලබන අතර එය සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද සඳහා ඇස්තමේන්තු කිරීම මත ගණනය කරනු ලැබේ. අරමුදල විසින් ලබා දී ඇති ලිඛිත තහවුරු කිරීම අනුව එවැනි ඇස්තමේන්තුගත අගයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් තුළ පිළිබිඹු කෙරේ.<br>ඒ අනුව 2023 මුදල් වර්ෂය තුළ ගිණුම් පොත්වල මෙම ඇස්තමේන්තු දෝෂය නිවැරදි කෙරෙනු ඇත. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනයට ගෙවිය යුතු දෑ | 6,512,810 | 5, 396,778 | 1,116,032 | අධිකාරියේ වාර්තාවලට අනුව රු.6,512,810 ක් යනු උපලේඛනයක් සහිතව 2010 වර්ෂයේ සිට අඛණ්ඩව පවතින ආරම්භක ශේෂයකි. කෙසේ වෙතත් මෙම ශේෂයන් සඳහා ලේඛනගත සාක්ෂි නොමැත. එබැවින් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) දිගුකාලීන ආයෝජන | 54,640,268 | ආයෝජන සහතික | මෙම ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත අදාළ ඉල්ලීම ඉදිරිපත් කර ඇත. | මෙම ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීමට නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) ප්‍රාග්ධන සංචිත වල හර ශේෂය | 243,736,884 | මූලාශ්‍ර ලේඛන | | |
| (ඇ) විදේශ කාර්යාල වලින් ලැබිය යුතු තැන්පතු | 3,661,032 | ශේෂ තහවුරු කිරීම් | | |
| (ඈ) සංවර්ධන පිරිවැය | 214,850,160 | සංවර්ධන පිරිවැය ලේඛනය | "සංවර්ධන පිරිවැය ලේඛනය" සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | "සංවර්ධන පිරිවැය ලේඛනය" සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුළු වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 36 ක් වූ වෙළඳ ණයගැතියන් රු.102,321,232 ක් වසර 03 කට වැඩි කාලයක් තිස්සේ ආපසු අයකර ගෙන නොතිබුණි. | අධිකාරියෙහි කල්බදු වත්කම්වල හිඟ කුලියට අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා නිවාඩු නිකේතන කළමනාකරණ අංශයෙන් වෙනම නිලධාරියෙකු පත් කර ඇත. තවද, මේ සඳහා මූල්‍ය කළමනාකරණ අංශයෙන් | ණයගැති කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල් ඉකුත් වූ ණය ගැතියන් සඳහා අධිහාරයක් පැනවිය යුතුය. |

| | | |
|---|---|---|
| | වෙනම නිලධාරියකු වහාම පත් කරනු ලැබේ. | |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුළු විවිධ ණය ගැතියන්ගෙන් සියයට 93 ක් වූ විවිධ ණය ගැතියන් රු.5,832,396ක්, වසර 05කට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි. තවද, විවිධ ණය ගැතියන් තුළ රු.559,961ක නොපියවූ ආරම්භක ශේෂයක් තිබුණි . | ලිඛිත සාක්ෂි සොයා ගැනීමට නොහැකි බැවින් ආරම්භක ශේෂය වූ රු.559,961ක මුදල කපා හැරීමට කටයුතු කරනු ලැබේ. නිවාඩු නිකේතනවල සුළු මුදල් පියවීමට අදාළ රු.163,816 ක ශේෂය දැනටමත් නිරවුල් කර ඇති නිසා 2023 මුදල් වර්ෂය තුළ ගිණුම් පොත් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. අනෙකුත් ශේෂයන් අයකර ගැනීමට සහ පසු විපරම් කිරීමට අදාළ අංශ වෙත දන්වා ඇත. | ණයගැති කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල් ඉකුත් වූ ණය ගැතියන් සඳහා අධිභාරයක් පැනවිය යුතුය. |
| (ඇ) රු.9,310,774 ක් වූ ලැබිය යුතු තැන්පතු ශේෂයේ, 1989 සිට 2007 දක්වා විදේශයන්හි කාර්යාල කුලිය සඳහා තැන්පත් කර ඇති රු3, 281,823 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයේදී වත් පියවා නොතිබුණි. | මෙම ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරය වෙත අදාළ ඉල්ලීම ඉදිරිපත් කර ඇත. | නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කපා හැරීමට ක්‍රියා කළ යුතුය |
| (ඈ) විදේශීය සංචාරකයන් හට ප්‍රවාහන පහසුකම් ලබාදෙන ත්‍රී රෝද රථ රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලෙස සංචාරක අමාත්‍යාංශයෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කරන ලද " ටුක් ටුක් වැඩසටහන" වෙනුවෙන් වැයවන මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට එකග වී තිබුණු නමුත්, 2018 සහ 2019 වර්ෂයන්හි දරා තිබූ රු.13,227,648ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අය වී නොතිබුණි. | මෙම කරුණ විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමු කර ඔවුන්ගේ මගපෙන්වීම අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | 2023 වසරේ ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) නිවාඩු නිකේතන 02 කින් ලැබුණු රු.531,458 ක මුළු වටිනාකමකින් යුත් චෙක්පත් දෙකක් 2011 සහ 2019 දී අගරු වී තිබුණ ද ණයගැති ශේෂය නැවත ඇති නොකර ගිණුම්වල අගරු චෙක්පත් ලෙස තබා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳුකරුවන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර මෙම මුදල අදාළ ණයගැතියාගේ නමට මාරු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | ණයගැති ශේෂය යථා තත්ත්වයට පත් කර ඉක්මනින් ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඊ) 2021 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 03 දින තෙක් ස්පාඤ්ඤයේ පැවති එක්සත් | 2021 නොවැම්බර් 9 වන දින පැවති එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක | වෙනත් ආයතනයක පිරිවැය තවත් |

| | | |
|---|---|---|
| ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ වාර්ෂික රැස්වීම වෙනුවෙන් සංචාරක අමාත්‍යාංශ ලේකම් සහභාගි වී තිබුණු අතර ඒ වෙනුවෙන් අධිකාරිය විසින් දරන ලද පිරිවැය වූ රු. 1,398,426 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | සංවිධානය විසින් සංවිධානය කරන ලද UNWTO හි මහා සභා රැස්වීමට සහභාගී වන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිඛිතව ආරාධනා කරන ලදී. මේ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය දෑ අප විසින් සංවිධානය කරන ලදී. | ආයතනයකින් දැරිය යුතු නොවේ. ඒ නිසා මේ මුදල අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කළ යුතුයි. |
| (උ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට තානායම් 34 කින් අයවිය යුතු හිඟ කුලී ආදායමේ එකතු වටිනාකම රු.29,217,012 ක් වූ අතර ඉන් වසර 4 කට වැඩි හිඟහිටි කුලී ආදායම රු.13,030,560 ක් හෝ සියයට 45 ක් විය. ඒවා අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොමැති බව නිරීක්ෂණය විය. එමෙන්ම, වර්ෂ 04කට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩු වූ තානායම් 07ක් බදු දීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පාස්කු ප්‍රහාරය හා කොවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන් , 2019 සිට ආරම්භ වූ සලකා බැලෙන කාලසීමාව සඳහා ව්‍යාපාර බිංදුවට ආසන්න විය. එබැවින් බොහෝ තානායම් ආදායම් උපයා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස හිඟ කුලී මුදල් ඇති විය. නමුත් දැනට එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් වෙනම නිලධාරීන් 02 දෙනෙකු පත් කර ඇත. | හිඟ කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ රු. 159,397,435 ක තැන්පතු හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ රු.4,275,041ක් වටිනා කාලපරිච්ඡේදය හඳුනා නොගත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වටිනාකමක් විය. | හිමිකම් නොලද චෙක්පත් අදාල පාරිභෝගිකයාගේ ඉල්ලීම මත නිරවුල් කෙරේ. | 2023 වර්ෂයේදී ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වර්ෂ 2010 සිට 2013 වර්ෂය දක්වා යුනිසෙෆ් (UNICEF)ආයතනය, නිවාඩු නිකේතන ජංගම ගිණුම, කුච්චවේලි සහ පාසිකුඩා වශයෙන් දක්වා ඇති ස්ථාන 4 කට අදාලව එකතුව රු.2,180,326ක් ගෙවිය යුතු මුදල් වශයෙන් පෙන්වා තිබුණද එම ගිණුම් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන දිනය තෙක් කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා අතර ඒ අනුව කටයුතු කරනු ලැබේ. | 2023 වර්ෂයේදී ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත<br><br>(i) 26(3)වගන්තිය | සංචාරක කලාප හඳුනාගෙන ප්‍රධාන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය අරඹා තිබුණද, එම ප්‍රදේශ ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ්‍ය හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සකස් කර නොතිබුණි. | ලබා දී නොමැත. | ප්‍රකාශිත කලාප තුළ කළ හැකි සංචාරක ක්‍රියාකාරකම්, වාණිජ සහ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කළ යුතුය . |
| (ii) 48(4) වගන්තිය | අධිකාරියේ බලාත්මක ඒකකය මගින් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් ලියාපදිංචි නොවූ ආයතන අතුරින් ස්ථාන 504 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යෝජිත වුවද, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. | බලාත්මක කිරීමේ ඒකකය විසින් ලියාපදිංචි නොකළ ආයතන හඳුනාගෙන ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට කරුණු කිහිපයක් බලපා ඇත. කෙසේ වෙතත්, ප්‍රමාණවත් සාක්ෂි එකතු කිරීමේ අවශ්‍යතාවය හැර, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යා හැකි තත්ත්වයට පත්ව ඇත. | ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගත යුතුය . |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත (SOE)<br>i) 2.3 ඡේදය | සියලුම රජය සතු ව්‍යවසායන් මෙම අත්පොතෙහි අදාළ විධිවිධානවලට අනුකූලව තමන්ගේම පරිපාලන සහ මූල්‍ය අත්පොත් සකස් කර ගැනීමට අවශ්‍ය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, මේ දක්වා අධිකාරිය විසින් පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමත කර නොතිබුණි . | පරිපාලන අත්පොත සහ මූල්‍ය අත්පොත සංවර්ධනය කිරීම සඳහා සම්පත් දායකයින් ලබා ගැනීම සඳහා වෙන වෙනම උපදේශන ප්‍රසම්පාදන දෙකක් දැනටමත් ආරම්භ කර ඇත. අදාළ දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටු පත් කර ඇති අතර දැනට ලේඛන ඇගයීම් අදියරේ පවතී. | අත්පොත් දෙක සකස් කිරීමට ඉක්මන් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii) 3.2 ඡේදය | ආයතනයේ ප්‍රවාහන දීමනාව ලෙස ගෙවනු ලබන රු.4000ක දීමනාවට අමතරව රු.6000ක අමතර දීමනාවක් 2022 ඔක්තෝබර් 01 දින සිට රේබීය අමාත්‍යාංශයේ නිර්දේශය ඇතිව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සේවකයන්ට ගෙවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මාස 03ක් සඳහා නිලධාරීන් 185ක් වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවූ මුදල රු.3,305,700ක් වී තිබුණි. | ගරු සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා විසින් ගරු මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය ඉල්ලා ඇති අතර අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. | භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| iii) 3.4 ඡේදය | සෑම රජය සතු ව්‍යවසායකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අධිකාරිය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | ලබා දී නොමැත. | අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසාය (SOE) සඳහා ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ<br><br>i) 2.1 ඡේදය | රජය සතු ව්‍යවසායක සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යභාරය පැහැදිලිව වෙන් විය යුතු බවට සඳහන් කර ඇතත්, අධිකාරියේ සභාපතිවරයා ලෙස කටයුතු කළ නිලධාරියාම 2023 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩබලන පත්වීමක් ලෙස අධ්‍යක්ෂ ජනරාල් ධූරයට අධිකාරියේ යහපාලනයට බලපෑම් ඇතිවන අයුරින් පත් කර තිබුණි. තවද, 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.4 ඡේදයේ (viii) වගන්තිය අනුව තනතුරක් පුරප්පාඩු වූ විට, ඒ සඳහා දින නියමයක් නොමැතිව වැඩබලන පදනම මත පත්වීමක් සිදු නොකළ යුතු අතර, නීතියක් ලෙස, නිලධාරියෙකු ස්ථිර තනතුරක් පමණක් දැරිය යුතුය.. කෙසේ වෙතත්, සභාපතිවරයා මේ දක්වා මාස 03කට වැඩි කාලයක් සිය වැඩබලන තනතුර දරන අතර අමාත්‍යවරයා විසින් | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 10 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව ගරු. සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් ස්ථිර අධ්‍යක්ෂ ජනරාල් පත්වීමක් ලබා දෙන තුරු අධිකාරියේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස අධිකාරියෙහි සභාපති ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා 2023.02.01 දින පත් කර ඇත.<br>මෙම පත් කිරීම අතුරු පියවරක් ලෙස සැලකිය යුතු බවත්, නියමිත කාලය තුළ ස්ථිර ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීමට නියමිත බවත් සඳහන් කිරීම වැදගත්ය . | ඉදිරියේදී යහපාලනය උල්ලංඝනය කරමින් දින නියමයක් නොමැතිව වැඩබලන පත්වීම් සිදු නොකළ යුතුය. |

වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීම් ලිපියේ නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.579,760,623 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.101,319,843ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.681,080,466ක ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අපගමන බදු ආදායම රු.295,943,528 කින් ද, ගාස්තු සහ බලපත්‍ර ආදායම රු.59,941,265 කින් ද, අනෙකුත් ආදායම් රු.151,232,924 කින් ද වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) යාල සංචාරක සංවර්ධන කලාපයේ අක්කර 35 ක් 2014 වර්ෂයේදී සමාගම් 5 කට ද, තවත් අක්කර 16.8 ක් 2019 සහ 2020 වර්ෂවල දී සමාගම් 2 කට ද බදු දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට බදු දුන් සමාගම් 7 න් සමාගම් 2 ක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. 2014 වර්ෂයේදී බදු ගත් සමාගමකට මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් මහාධිකරණයෙන් දුන් අතුරු තහනම් නියෝගයක් පිළිබඳව අධිකාරිය දැනුවත් කර හිඟ බදු මුදල් ගෙවා තිබියදී, 2020 මැයි මස අධිකාරිය විසින් “මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම” හේතුව ලෙස දක්වා එම බදු ගිවිසුම අවසන් කර තිබුණි. බදු ගිවිසුම අවසන් කිරීමට එරෙහිව බදුකරු විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා අධිකාරියට එරෙහිව වාරණ නියෝගයක් ලබා ගෙන තිබුණු නමුත් අධිකාරිය 2020 ඔක්තෝම්බර් 22 දින එම ඉඩම තවත් සමාගමකට බදු දීමට කටයුතු කර තිබුණි. එයට විරුද්ධව නැවත මුල් බදුකරු විසින් නඩුවක් ගොනු කර තිබුණු අතර මෙම සියලු නඩු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා නොගෙන පෞද්ගලික නීතිඥයන්ගේ සේවය ලබාගෙන 2021 හා 2022 වර්ෂවලදී රු.3,475,000ක් නීති ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | 2019 අගෝස්තු 14 වැනි දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බදු ගිවිසුම අවලංගු කර එම ඉඩම වෙනත් සමාගමකට ලබාමට තීරණය විය. | මේ සියලු නඩු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබාගත යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 05 හි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙළින් රු.51,269,048 සහ රු.72,533,150ක එකතු අලාභයක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂය තුළ සංචාරක නිකේතන පහේ අඛණ්ඩ අලාභයක් සිදු වී තිබුණි. කෙසේ වෙතත්, එම නිවාඩු නිකේතනවල පාඩුව අවම කර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි. | ලබා දී නොමැත. | ජාතික නිවාඩු නිකේතන ලාභ ලබන ආකාරයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය . |
| (ආ) සභාපතිනියගේ කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක විසින් 2020 වර්ෂයේ අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයෙන් එකතුව රු1,072,102.ක ටෝනර් සභාපතිනියගේ අත්සන් සහිත භාණ්ඩ ඉල්ලුම් පත්‍ර මඟින් ලබාගෙන තිබුණු නමුත් ඒවා අධිකාරියේ ගබඩාවට ලැබී නොතිබුණි. එකී භාණ්ඩ ඉල්ලීම පිළිබඳව හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් අධිකාරියේ සභාපතිනියට සහ අධ්‍යක්ෂ ජනරාල්වරියට විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් දැනුවත් කර තිබුණ ද, ඒ පිළිබඳව කිසිදු පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සිදුකර නොතිබුණි .එසේ තිබියදී, 2021 අගෝස්තු 05දින එකී කාර්යාල කාර්ය සහායක සහ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ කාර්යාලයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක විසින් රු.1,234,540 ක් වටිනා ඡායා පිටපත් සහ ටෝනර් ගබඩාවෙන් සොරාගෙන තිබුණු අතර ඔවුන්ගේ සේවය අත්හිටුවීමට කටයුතු කළ ද, 2022 අගෝස්තු 24 දින නිකේතන කළමනාකරණ අංශයේ තිබුණු අලුතින් මිලදී ගත් රු.198,500 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් ද අස්ථානගත වී තිබුණි.ඒ අනුව, මුලින් ලද පැමිණිලි සම්බන්ධයෙන් කළමනාකරණය සක්‍රීයව මැදිහත් නොවීම සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි දුර්වලතාවය හේතුවෙන් දිගින් දිගටම වංචා සිදුවන පරිසරයක් අධිකාරිය තුළ නිර්මාණය වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ. | ගබඩාවල සිදුවූ සොරකම් කරන ලද ටෝනර් සහ ඡායාපිටපත් කඩදාසි සිද්ධිය සම්බන්ධයෙන් දැනටමත් අධිකාරියෙහි විනය පරීක්ෂණයක් ආරම්භ කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ඊට අමතරව අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී . සිද්ධියෙන් පසුව, ප්‍රධාන වශයෙන් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන, ආරක්ෂාව සහතික කිරීම සඳහා ආරක්ෂක කැමරා පද්ධතිය ශක්තිමත් කරන ලද අතර වගකීම් වෙන් කර, ආරක්ෂක නිලධාරීන්ට පුළුල් මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදී. කොල්ලුපිටිය පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරන ලදී. නොසැලකිලිමත්කම මත වගකිව යුතු නිලධාරීන් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විනය පරීක්ෂණයක් ආරම්භ කිරීමට නියමිතය. | ආරක්ෂක කැමරා පද්ධතිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීමට සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට නිලධාරියකු පත් කිරීමට කටයුතු කළ යුතුය. තවද, නොසැලකිල්ල මත වගකිව යුතු නිලධාරීන් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විනය පරීක්ෂණයක් ආරම්භ කළ යුතුය . |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පුත්තලම දිස්ත්‍රික්කයේ මදුරන්කුලියෙහි සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම (විවේකාංගනයක්) සඳහා 2016 ඔක්තෝම්බර් 27 දින වන විට ඉදිරිපත්කර තිබුණු බිල්පත්‍ර සඳහා අධිකාරිය රු.6,771,807ක මුදලක් වයඹ පළාත් සභාවට ගෙවා තිබුණි. කෙසේ වුවද, රු.5,846,556ක ඉතිරි කළ වැඩ වෙනුවෙන් 2016 දෙසැම්බර් 22 දින වනවිට ඉදිරිපත් කළ බිල්පත් වල ඉංජිනේරු සහතික කිරීම් දෝෂ සහිත බව දක්වමින් අධිකාරිය විසින් එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිදහස් කර නොතිබුණු අතර ඒ හේතුවෙන්ම ව්‍යාපෘතියද අතරමග නවතා අක්‍රිය මට්ටමක පැවතුණු අතර මේ දක්වා සිදුකර තිබුණු ඉදිකිරීම් නිසිපරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ජල කාන්දු වී දිරා යමින් විනාශ වී පැවතුණු බව භෞතික විගණන පරීක්ෂාවකදී හෙළිදරව් විය. | ලබා දී නොමැත. | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කළ යුතු අතර ප්‍රාග්ධන ව්‍යාපෘති පිරිවැය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා බලාත්මක ඒකකය මගින් සිදුකළ විමර්ශනයන්ට අනුව සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යන ලියාපදිංචි නොකළ ආයතන 640 ක් හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ආයතන 20 ක් පමණක් 2022 ජූලි 03 දින වන විට ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව, අවිධිමත්ව සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර කරගෙන යන ආයතන බලාත්මක ඒකකය විසින් නියාමනය කිරීම ඉතා පහළ මට්ටමක පැවති බව පෙනේ. කළමනාකරණය විසින් මෙම ඒකකයේ කාර්යසාධනය පිළිබඳව ද ප්‍රමාණාත්මක ඇගයීමක් සිදුනොකර එම ඒකකයේ උපදේශක, විමර්ශන නිලධාරී සහ නීති උපදේශක වෙනුවෙන් දීමනා වශයෙන් පමණක් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා එකතුව රු. 13,397,500 ක් ගෙවීමට කටයුතු කර තිබුණි. | බලාත්මක ඒකකය විසින් ලියාපදිංචි නොකළ ආයතන හඳුනාගෙන ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට කරුණු කිහිපයක් බලපා ඇත. කෙසේ වෙතත්, ප්‍රමාණවත් සාක්ෂි එකතු කිරීමේ අවශ්‍යතාවය හැර, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට කටයුතු කරමින් පවතී. | ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව පියවර ගත යුතුය . |
| (ඇ) පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත හෝටල් හා ඊට සම්බන්ධ ආයතනවල මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අධිකාරිය 2011 ජුනි 18 දින පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර පද්ධතිය නඩත්තු කර පවත්වා ගෙන යාම, පරිශ්‍රයේ පිහිටි හෝටල් 14 න් ගාස්තු අයකර ගැනීම සහ ඉහත | ලබා දී නොමැත. | ඉක්මනින් අවසන් නිගමනයකට පැමිණ අධිකාරියට සිදුවන පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පුද්ගලික සමාගමට එසේ අයකරගත් මුදල් ගෙවීම අධිකාරියේ වගකීමක් විය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පර්චස් 118 ක ඉඩම අධිකාරිය විසින් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට හෝටල් 14 න් අයවිය යුතු මුදල රු.354,623,534 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද ගිවිසුම ප්‍රකාරව ඉහත පෞද්ගලික සමාගමට ගෙවිය යුතු මුළු මුදල හෝටල් වලින් ලැබිය යුතු ප්‍රමාණය ද ඉක්මවමින් රු. 362,971,725 ක් වී තිබුණි. 2021 අප්‍රේල් 20 දින, මෙම පද්ධතිය අධිකාරියට පවරා ගැනිමේ හැකියාව පිළිබඳව මූල්‍ය උපදේශනය ලබා ගැනීම සඳහා රු.1,644,750ක් වූ පිරිවැයකට පෞද්ගලික අංශයේ බද්ධ ව්‍යාපාරයක් තෝරාගෙන එයට ප්‍රදාන ලිපිය නිකුත්කර තිබුණු නමුත් ඒ සම්බන්ධ අවසාන නිගමනයක් ද 2022 සැප්තැම්බර් 05 දින වන විටත් ගෙන නොතිබුණි. | | |
| (ඇ) 2011 සහ 2014 වර්ෂවලදී අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086ක් වූ භූමි ප්‍රමාණයෙන් 2020 වර්ෂය වනවිට ඉඩම් අක්කර 35ක් පමණක් සමාගම් 2කට බදු දී තිබුණු අතර 2021 මැයි මාසයේදී අක්කර 14ක් තවත් සමාගමකට බදු දී තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් බදු දී තිබුණු සමාගම් 3න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. | ඉඩම් අක්කර 46ක නව ආයෝජක ව්‍යාපෘති 4ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය සියලුම අනුමැතිය ලබාගෙන ඇත. සංචාරක අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද DPEC (සංවර්ධන ව්‍යාපෘති ඇගයීම් කමිටුව) විසින් ඇගයීම් අදියරේ පවතින කුච්චවේලි වෙරළ නිකේතනය සඳහා තවත් නව යෝජනා හතරක් අප වෙත ලැබී ඇත . | බදු ඉඩම් සඳහා හැකියාව සහිත ආයෝජකයින් ගෙන්වා ගෙන මෙහෙයුම් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12ක ඉඩම් අක්කර 2057.90ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12න් දූපත් 05කට අයත් ඉඩම් අක්කර 206.74 ක් පමණක් 2011 ,2010 සහ 2020 වර්ෂවලදී සමාගම් 03ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි .බදු දී තිබුණු සමාගම්වලින් සමාගම් 2 ක පිළිවෙලින් රු.43,275,455 ක් සහ රු.9,063,277 ක් වශයෙන් වසර 3 සිට වසර 5 දක්වා බදු කුලිය හිඟව පැවතුණි. | ජලාශ්‍රිත බංගලා සඳහා අනුමැතිය නොලැබීම, ධීවර සමාජය ආශ්‍රිත ගැටළු, දූපත් වල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම යනාදී කරුණු හේතුවෙන් ව්‍යාපෘති ප්‍රමාද විය . 2023 මැයි මාසයේදී, ආයෝජකයින් 4 දෙනෙකු සමඟ තවත් බදු ගිවිසුම් 4ක් අත්සන් කර ඇත. කෙසේ වෙතත්, යටිතල පහසුකම් සීමා කිරීම් සහ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන්, ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය | කල්බදු දූපත් සඳහා හැකියාව ඇති ආයෝජකයින් ගෙන්වා ගැනීමටත්, අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටත්, ඉකමනින් මෙහෙයුම් ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | බලාපොරොත්තු වූවාට වඩා මන්දගාමී විය. | |
| (ඊ) ජෛව විවිධත්ව මූල්‍ය මුලපිරීම (BIOFIN) ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනක් (UNDP) අනුමත කරන ලද රු.මිලියන 6.917 ඉක්මවා මුළු පිරිවැය රු.මිලියන 15.1ක් දරමින් 2019 ජනවාරි සිට මාර්තු දක්වා අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ක්‍රියාත්මක කර තිබුණි. UNDP විසින් අනුමත මුදල පමණක් ලබා දී තිබූ අතර ඉතිරි රු.මිලියන 8.183 නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව අධිකාරියේ අරමුදල් හරහා ලබාගෙන තිබුණි. ගිවිසුමට අනුව කාර්තුමය ප්‍රගති වාර්තා UNDP වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2021 ජූනි 08 දින විශ්‍රාම ගිය නිලධාරියෙකු රු.455, 017 ක පිරිවැයක් දරා ගෝලීය සංචාරක තිරසාර සහතික කිරීමේ සමුළුවට සහභාගී වී තිබුණි. තවද, 2022 ඔක්තෝබර් 26 වන විට වර්ගීකරණය කරන ලද හෝටල් 138කින් තිරසාර සංවර්ධන සහතික හෝටල් 31කට පමණක් ලබා දී තිබූ අතර , වසර 03කට වැඩි කාලයක් ගත වී තිබුණද වසර දෙකකට වරක් අලුත් කිරීම් සිදු කර නොතිබූ අතර මේ දක්වා තිරසාර සංචාරක පරීක්ෂකවරුන් පුහුණු කර නොතිබුණි. | ලබා දී නොමැත. | සියලුම වැඩසටහන් පිරිවැය ඵලදායී ආකාරයෙන් සිදු කළ යුතුය. |
| (උ) 2019 වර්ෂයේදී රු.61,000,000 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණද , මන්නාරමේ ඉඩමක අයිතිය අද දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා මන්නාරම නගරයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත 2019 වර්ෂයේදී රු.මිලියන 61ක් තැන්පත් කර ඇති බව සැබෑය. ඉන්පසුව, මන්නාරම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන 2 වගන්තියට අදාල දැන්වීම් ද ප්‍රකාශයට පත් කරන ලද නමුත්, සංචාරක නිකේතන සංවර්ධනය සඳහා තම ඉඩම් ලබා දීමට අකමැති වූ සමහර පෞද්ගලික අයිතිකරුවන් වූහ. අධිකාරිය ඒ පිළිබඳව නිරන්තරයෙන් පසු විපරම් කරයි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පසු විපරම් කර ඉක්මනින් ඉඩම පවරා ගත යුතුය. |
| (ඌ) ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.39,227,275 ක් සහ ගොඩනැගිලි ඉදිකිරීම | අදහස පැහැදිලි නැත. | ලබා දී ඇති වැඩ අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට |

| | | |
|---|---|---|
| සඳහා රු.12, 264,582 ක් ලෙස වසර 04 කට පෙර ගෙවා ඇති අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ නිවාඩු නිකේතනවල වාර්ෂික ස්ථාවර වත්කම් සත්‍යාපනයේ දී වත්කම් පන්ති 06 ක අයිතම 108 ක හිඟයක් සහ වත්කම් පන්ති 04 ක අයිතම 139 ක අතිරික්තයක් හඳුනා ගෙන තිබුණි. එම හිඟය සහ අතිරික්තය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. ස්ථාවර වත්කම්වල අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. | ජාතික නිවාඩු නිකේතනවල වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනයේදී හෙළිදරව් වූ අතිරික්ත හා හිඟ සංසන්දනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අතිරික්ත හා හිඟ නියමිත වේලාවට සංසන්දනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාල ජාතික වනෝද්‍යානය ආසන්නයේ පිහිටි නිකේතන ප්‍රදේශයේ පර්චස් 50 ක ඉඩමක් 2021 වර්ෂය තුළදී මණ්ඩලයේ අනුමැතිය ඇතිව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ දිවියන් පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පුද්ගලික සමාගමකට නොමිලේ ලබා දී ඇති බව නිරීක්ෂණය විය. ගිවිසුම අත්සන් කිරීමේ සම්බන්ධිත පාර්ශව බැඳීම සහ පුද්ගලික සමාගම තෝරා ගැනීමේ ක්‍රමය පිළිබඳ විගණනයේදී ගැටලු සහගත විය. | එකල ඉහත කී ‘දිවියන් පර්යේෂණ මධ්‍යස්ථානය’ සඳහා බදු ගිවිසුම අත්සන් කළ සභාපතිනිය එම ගිවිසුමට සම්බන්ධ පෞද්ගලික ආයතනයට සම්බන්ධ පාර්ශ්වයක් විය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය පිළිබඳ මූලික සාකච්ඡා 2017 වසරේ ආරම්භ වූ අතර, 2017-2019 කාලසීමාව තුළ අවශ්‍ය සියලුම අනුමැතීන් ලබාගෙන ඇති අතර, එහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතිය 2019 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කරන ලදී. මෙය සම්බන්ධිත පාර්ශව බැඳීමක් ලෙස නොසැලකිය යුතු වේ. | සම්බන්ධිත පාර්ශව බැඳීමක් සහිත ගනුදෙනු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.6 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සතු තානායම් 37 න් 9ක් වර්ෂ දෙකේ සිට අට දක්වා කාලසීමාවක පරාසයකට බදු දී නොතිබූ බැවින් එම දේපල ඌන උපයෝජිතව පැවතුණි. | ලබා දී නොමැත. | ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක ඩීපීස්/ එල්එන්ඩී/03/බීජ්එන්/පොදු සහ 2017 ජුනි 20 දිනැති ලිපිය පරිදි 2017 වර්ෂය වන විට රු. | අගමැතිවරයා සහ සංචාරක අමාත්‍යාංශයේ රු.මිලියන 500 ක මුදලක් පළමු පියවරේදී ශ්‍රී ලංකාවට | ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| 173,159,909 ක් ගෙවා දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපාතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. . | ලබා දිය යුතු බවට වූ කොන්දේසිය සපුරාලීමට නොහැකි වීම නිසා මැලේසියානු ව්‍යාපෘතිය අවලංගු කරන ලදී. එමෙන්ම, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වන මායිම් නිරවුල් කර ගැනීම සහ ආක්‍රමණය වැළැක්වීම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටී. | යුතුය. |

**3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පරිසර හිතකාමී කඩ කාමර 20 ක්, එක් කුටියකට බංකු 02 ක්, ආරක්ෂිත වැටක් සහ නාම පුවරුවක් ඉදිකිරීමේ අරමුණ ඇතිව රු. 7,488,133 ක වැඩ වටිනාකමකින් 2017 පෙබරවාරි ආරම්භ කර 2017 දෙසැම්බර් 15 දින වන විට වැඩ අවසන් කිරීමට බලාපොරොත්තුවූ දූන්හිඳ ඇල්ල ව්‍යාපෘතිය 2018 ජනවාරි 22 දින වන විට රු.2,864,289 ක එකතු වියදමකින් කඩකාමර 10ක් සහ නාම පුවරුව පමණක් ඉදිකර වැඩ නවතා තිබුණි.කෙසේවුවද, 2021 වර්ෂයේ දී, දූන්හිඳ ව්‍යාපෘතිය- අදියර II යටතේ තවත් කඩ කාමර 5 ක් රු. 2,350,000 ක වියදමකින් නිම කිරීමට අධිකාරිය තීරණය කර තිබුණ ද, මුල් සැලසුමේ වූ කාමර 5ක් ඉදිකිරීම අත්හැර තිබුණි. තවද, එක් කාමරයකට එවකට රු. 272,429 ක් වූ පිරිවැය වසර 4 ක ප්‍රමාදය හේතුවෙන් රු. 470,000 ක් දක්වා සියයට 72 ක් වර්ධනය වී තිබුණි. | ලබා දී නොමැත. | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කළ යුතු අතර ප්‍රාග්ධන ව්‍යාපෘති පිරිවැය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මදුරන්කුලිය , දූන්හිඳ ඇල්ල සහ කල්පිටිය දේශීය සංචාරක ව්‍යාපෘතිවලට අදාළව නොනිම් වැඩ ගිණුමේ රු.32,593,999 ක් වූ මුදල වසර 05 කට වැඩි කාලයක් අතහැර දැමූ ව්‍යාපෘති ලෙස ඉතිරිව තිබිණි. | ව්‍යාපෘති අවසන් කර නොමැති අතර ඒවා අවසන් වූ පසු ගිණුම් පොත්වල අවශ්‍ය ගිණුම් ගැලපීම් සිදු කරනු ඇත . | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව පසු විපරම් කර ඵලදායී ලෙස නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් යාල පිවිසුම් දොරටුව සහ නිවාඩු නිකේතන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු55,000,000 ක මුදලකට ලබා දී ඇති කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC) ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ යෙදවුම් ඇතිව අධිකාරිය විසින් යාල සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කරන ලදී. සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති නැවැත්වීමට රජය විසින් නිකුත් කර ඇති නියෝගය සැලකිල්ලට ගනිමින්, එම කටයුතු නවතා ඉදිරියේදී ඒ | ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව පසු විපරම් කර ඵලදායී ලෙස නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |

පිළිබඳව සලකා බැලීමට තීරණය කරන ලදී.

### 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.15,000,000 ක ඇස්තමේන්තුගත මුදලකට 50 KW සූර්ය බලැති විදුලි ජනන පද්ධතිය සහ අකුණු ආරක්ෂණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේදී ප්‍රසම්පාදනයක් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය සම්පූර්ණ කර නොතිබුණි. තවද, 2022 පෙබරවාරි 22 වැනි දින පැවති පූර්ව ලංසු රැස්වීමේ දී තීරණය කළ පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය මේ දක්වා ලබාගෙන නොතිබූ අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් අධිකාරියේ අභ්‍යන්තර සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත වී තිබුණි. | අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව සංවර්ධන, නිකේතන කළමනාකාරීත්වය සහ මූල්‍ය අංශවල නිලධාරීන්ගෙන් සමන්විත වන අතර ඔවුන් ඉහත කී ව්‍යාපෘතියට සෘජුව සම්බන්ධ නොවේ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ (උපදේශක) අධීක්ෂණය යටතේ සිදු කෙරේ . තවද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සංචාරක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගෙන් සමන්විත වේ. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවය සහ අනුකූලතාව මත සිදු කෙරේ. | අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් දක්ෂ ස්වාධීන පුද්ගලයකුගෙන් සමන්විත විය යුතුය. වැදගත් ව්‍යාපෘති කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට තවදුරටත් ක්‍රියා කළ යුතුය. |

### 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 ජනවාරි 12 දිනැති ලිපිය මගින් වැඩ තහනම් කරන ලද නිලධාරියෙකු, චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව 2023 මාර්තු 30 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබුණි. 2023 අප්‍රේල් 28 දිනැති චෝදනා පත්‍රය ඉහත නිලධාරියා වෙත නිකුත් කර තිබූ අතර ඊට ප්‍රතිචාරය 2023 මැයි 17 දින ලැබී තිබුණි. විමර්ශන නිලධාරියා සහ නඩු පවරන නිලධාරියා අධිකාරිය විසින් පත් කර තිබුණි. කෙසේ වෙතත්, මේ දක්වා විධිමත් විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොතිබුණි | විනය පරීක්ෂණය ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතයි. | විනය පරීක්ෂණය ඉකමනින් ආරම්භ කර අවසන් කළ යුතුය. |